කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2011
2012 දෙසැම්බර් / 2013 ජනවාරි

මානවශාස්ත්‍ර පීඨය

බෞද්ධ දර්ශනය - BUPH E 2025

බෞද්ධ සමාජ දර්ශනය, පාරභෞතික ප්‍රස්තුත හා සමායාන්තර චින්තා

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි                                                    කාලය : පැය 03 යි

---

01. ''එවං නත්ථි මනුස්සෙසු ලිඞ්ගං ජාතිමයං පුථු'' අදාළ මූලාශ්‍රයානුසාරයෙන් ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

02. ධනෝපායනයෙහි ධාර්මික පදනමත්, පරිභෝජන දර්ශනයෙහි සමාජශීලී භාවයත් බෞද්ධ ඉගැන්වීම් තුළ අන්තර්ගතවන අයුරු පෙන්වා දෙන්න.

03. ස්ත්‍රී, සුරා සහ ද්‍යූ කෙලියෙහි ලෝලත්වය පුද්ගල මෙන්ම සමාජ පරිහානිය කෙරෙහි බලපාන අයුරු ප්‍රකට කරන්න.

04. රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතනවල අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම පිණිස සේව්‍ය- සේවක දෙපක්ෂය තුළ අන්‍යොන්‍ය සුහදතාව ඇති කිරීම සඳහා සුදුසු බෞද්ධ ඉගැන්වීම් නිර්දේශ කරන්න.

05. රජය සහ ජනතාව අතර ඇතිවන ගැටුම් හා අර්බුද නිරාකරණය කිරීමෙහි ලා බෞද්ධ දේශපාලන සංකල්ප කෙතෙක්දුරට උපයෝගී කරගත හැකිදැයි පරීක්‍ෂා කරන්න.

06. සත්ත්වයා සහ ලෝකය පිළිබඳ නිර්මාණවාදී අදහස් බෞද්ධ මූලධර්ම මගින් නිශේධනය වන අයුරු පෙන්වා දෙන්න.

07. ආත්මවාදය හා අනාත්මවාදය පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයමින්, බුදුදහම මධ්‍යම දේශනාවක් වහයෙන් නම් කිරීමේ යුක්ති යුක්තතාව ගෙනහැර දක්වන්න.

08. කර්මය, පුනරුත්පත්තිය සහ මෝක්ෂය පිළිබඳ සමකාලීන මතවාද බුදුදහමින් ප්‍රතික්ෂේප වන්නේ දැයි විමසන්න.

09. පාරභෞතික සංකල්ප පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයා, බුදුදහමින් පාරභෞතික ඉගැන්වීම් සපුරා බැහැරවන්නේ දැයි පරීක්‍ෂා කරන්න.

10. දස අව්‍යාකෘත ප්‍රශ්න හඳුන්වා දී, ඒවා ඨපනීය වශයෙන් සැළකීමේ හේතු සාධක ඉදිරිපත් කරන්න.

*******************************